<u>අධ්‍යාපන අමාත්‍යාංශය</u>

<u>ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය /ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණය සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම .</u>

<u>**2021/2022** අධ්‍යයන වර්ෂය</u>

**2021/2022** අධ්‍යයන වර්ෂයෙන් ආරම්භ කරනු ලබන පහත සඳහන් පාඨමාලා හැදෑරීම පිණිස ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා ඉංග්‍රීසි විෂය සහිතව සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් රජයේ හෝ රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. කලා උපාධි පාඨමාලාව (ඉංග්‍රීසි විෂය සහිත)

II. විද්‍යාවේදී උපාධි පාඨමාලාව (ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා පාඨමාලා)

**02.** ඉල්ලුම්කරුවන් මේ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

I. කලා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන ගුරුවරුන් **2017** වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයකදී ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය/ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණය සමත්ව තිබිය යුතුය.

II. ජෛවීය විද්‍යා , භෞතීය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා යන පාඨමාලා සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන ගුරුවරුන් **2017** වර්ෂයේ හෝ ඊට පසු පැවැත්වූ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත්ව තිබිය යුතුය.

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ගුරුවරයෙකු වශයෙන් අවුරුදු **05**ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. අදාළ ගුරු පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

IV. දැනටමත් ගුරු අභ්‍යාස විද්‍යාලයක, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක, විශ්වවිද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතුය.

V. යම් විශ්වවිද්‍යාලයක පවත්නා ජෛවීය විද්‍යා , භෞතීය විද්‍යා හෝ ව්‍යවහාරික විද්‍යා පාඨමාලාවක් සම්බන්ධයෙන් වූ විට, අදාළ පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේදී හෝ අදාළ විශ්ව විද්‍යාලය විසින් පූර්ව අවශ්‍යතාවක් ලෙස දක්වනු ලබන විෂයයන් සඳහා සාමාර්ථ ලබා තිබිය යුතුය.

VI. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔවුනට අධ්‍යයන නිවාඩු ලබා දිය යුතු බැවින් එසේ අධ්‍යයන නිවාඩු හිමිකම් ඇති ගුරුවරුන් පමණක් මේ සඳහා අයදුම් කළ යුතුය.

03. මෙම ප්‍රවේශය යටතේ සිසුන් තෝරා ගනු ලබනුයේ ඉංග්‍රීසි විෂය සහිතව, සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණයේදී/ශාස්ත්‍රවේදී (බාහිර) පළමු පරීක්ෂණයේදී හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණයේදී ලබා ගත් මුළු ලකුණු අදාළ විෂයට ලබාගත් ලකුණු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පවත්වන සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු පදනම් කරගෙනය.

04. වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට ඇති හිමිකම් පිළිබඳ සම්මුඛ පරීක්ෂණයේදී විමසා බලනු ලැබේ.

05. උපාධි ලබා ගැනීමෙන් අනතුරුව උපාධි ගුරු පත්වීම් ලබාදීම පිළිබඳ වගකීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

06. රජයේ ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති , කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින්ද , රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත් අදාළ විදුහල්පති / කළමනාකරු විසින්ද සහතික කළ යුතුය.

07. රජය අනුමත කරන පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත්වල එම පාසලේ විදුහල්පති / කළමනාකරු විසින් අදාළ ගුරුවරිය / ගුරුවරයා සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කළ හැකි / නොහැකි බව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

08. සෑම අයදුම්පතක්ම මෙහි සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට පිටපත් දෙකකින් (02) යුතුව 2022.12.04 දිනට පෙර "අධ්‍යාපන අධ්‍යක්ෂ,මානව සම්පත් සංවර්ධන ශාඛාව,අධ්‍යාපන අමාත්‍යාංශය,"ඉසුරුපාය", බත්තරමුල්ල." ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු වේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත් 2021 / 2022 (ගුරුභවතුන් සඳහා) " යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය, මාධ්‍ය තුනෙන්ම (සිංහල,දෙමළ,ඉංග්‍රීසි) අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ **(www.moe.gov.lk)** විශේෂ දැන්වීම් තීරයේ පළ කර ඇත.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය